නාට්‍ය හා රංග කලාව

11 ශ්‍රේණිය

විභාග අංකය ........................................................ කාලය පැය තුනයි

සැලකිය යුතුයි

I. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

II.අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල , දී ඇති (1),(2),(3),(4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

- පහත දැක්වෙන සංවාද ඛණ්ඩ හා කවි ඇසුරෙන් අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A)ගදුහයා - මේ අවේලාවේ ඔබ වහන්සේ මේ විමානයට වැඩියේ ඇයි?

භික්ෂුව - මේ එන්නම වුවමනාවක් නිසා තමයි මම ආවේ.ඔබ ඉඩ දෙනවානම් මම කැමතියි මෙහේ නවාතැන් ගන්න අද රාත්‍රියට .

B)බමුණා - දේව මනුස්සාකං අත්ථි.බහු මනුස්සානං අත්ථිමණ්ඩපං අත්ථි.අලෝකං අත්ථිකිං කාරණං අත්ථි.

ඇදුරා - තොවිලයක් . මේ කරන්නේ තොවිලයක් .

C) නැතක් බලැති දොළසක් දෙවයන් නම ට
කොතෙක් පාලි කෙරුවත් නැත සිත සතු ට
මෙතෙක් කර දොළස ආතුර රැකීම ට
ඇතෙක් සොයා බැදලා දෙම් පඩුරක ට

D)යක් දෙස්සා - අනේ බොලන් මං උදැල්ලේම මාස ගණනක් ඇවිදිනවා

බෙරකරු - උදැල්ලේ නොවෙයි බන් නිදැල්ලේ .

යක් දෙස්සා - නිදැල්ලේ.

බෙරකරු - අනේ බොලන් මොකටද මෙච්චර කල් ඇවිද්දේ ?

01)ඉහත සදහන් (A) වැනි සංවාද ඛණ්ඩය අයත්වන ශාන්තිකර්මය / පූජාකර්මය වන්නේ,

(1) මිලින්ද ප්‍රශ්නයට ය. (2) ආලවක දමනයට ය.

(3) උඩරට ශාන්තිකර්මයකට ය. (4) දොරකඩ අස්නයට ය.

02) ඉහත සදහන් (B) වැනි සංවාද ඛණ්ඩය අයත්වන ශාන්තිකර්මය / පූජාකර්මය වන්නේ,

(1) සන්නි යකුමට ය. (2) සූනියම් යාගයට ය.

(3) කොහොඹා කංකාරියට ය. (4) දොවොල් මඩුවට ය.

03)ඉහත සදහන් (C) වැනි කවිය අයත්වන ශාන්තිකර්මය / පූජාකර්මය වන්නේ,

(1) රට යකුමට ය. (2) දොවොල් මඩුවට ය.

(3) කොහොඹා කංකාරියට ය. (4) සුනියම් යාගයට ය.

04)ඉහත සඳහන් (D) වැනි සංවාද ඛණ්ඩය අයත්වන ශාන්තිකර්මය / පූජාකර්මය වන්නේ,

(1) මිලින්ද ප්‍රශ්නයට ය. (2) ආලවක දමනයට ය.

(3) උඩරට ශාන්තිකර්මයකට ය. (4) දොරකඩ අස්නයට ය.

05)පත්තිනි දේව ඇදහිල්ල මුල් කරගන්නා ශාන්තිකර්මයේ එන සංවාද ඛණ්ඩය හෝ කවිය වන්නේ,

(1) (A). (2) (B).

(3) (C). (4) (D).

- 06 සිට 16 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

06) නාට්‍යයක අත්‍යවශ්‍ය අංගත්‍රය වන්නේ

(1) අධ්‍යක්ෂකවරයා,පෙළ, නළුවා (2) අධ්‍යක්ෂකවරයා ,ආනුෂාංගික ශිල්පීන් , පෙළ

(3) නාට්‍ය පෙළ,සංගීතය, හා ප්‍රේක්ෂකයා (4) නාට්‍ය පෙළ,නළුවන්,හා ප්‍රේක්ෂකයා

07) ජෝන් ද සිල්වා මහතාගේ නූර්ති නාට්‍ය වන්නේ,

(1) රොමිලින් ,අලිබබා,දිනතර (2) පද්මාවතී ,නාගානන්ද,පණ්ඩුකාභය

(3) සිරිසඟබෝ,දුටුගැමුණු,උත්තර රාම චරිතය (4) ශ්‍රී වික්‍රම රාජසිංහ,ස්වර්ණතිලකා,ෂූලා

08) "සැප දුක මුසු වූ ලෝකයාගේ ස්වභාවය ආංගිකාදි අභිනයන් මගින් දක්වන කලාව නාට්‍යය නමින් හැඳින්වේ."
මෙම ප්‍රකාශය කරන ලද්දේ ,

(1) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් (2) භරතමුනිවරයා

(3) ශේක්ෂ්පියර් (4) බර්නාඩ් ෂෝ

09) නාට්‍යකදී නළුවෙකුට එම චරිතයට ඉක්මනින් සමාරෝපය විමට නොහැකි විය.ඔහුගේ මනස නිරවුල් නැත. ඔහු කළ යුතු රංග අභ්‍යාසය වන්නේ

(1) කටහඩ අභ්‍යාස (2) ශිථිලකරණ අභ්‍යාස

(3) තාපන අභ්‍යාස (4) දර්පණ අභ්‍යාස

10) දකුණුපස දැක්වෙන විදුලි පහන



(1) යොමු පහනකි.

(2) ස්ට්‍රිප් පහනකි.

(3) ධාරා පහනකි

(4) වර්ණ චක්‍රයකි

11) ප්‍රාසංගික කලා වන්නේ,

(1) නර්තනය ,මුද්‍ර නාට්‍ය,සංගීතය,ඔපෙරා,නාට්‍යය.

(2) නර්තනය ,චිත්‍ර කලාව,සාහිත්‍ය,ඔපෙරා,නාට්‍යය.

(3) මූර්ති ශිල්පය ,මුද්‍ර නාට්‍ය,කැටයම්,ඔපෙරා,නාට්‍යය.

(4) ගීත සාහිත්‍යය ,මුද්‍ර නාට්‍ය,සංගීතය,ඔපෙරා,නාට්‍යය.

12) වර්තමානයේ ලංකාවේ දෙමළ නාට්‍යය හා සම්බන්ධ මහාචාර්ය වරු දෙදෙනා වන්නේ

(1) එස් මෞනගුරු,හා ෂන්මුගලිංගම්.

(2) කේ සිවතම්බි හා චෞර්ණලිංගම්

(3) එස් කනපතිපිල්ලේ ,හා සුන්දරලිංගම්

(4) කේ සිවතම්බි හා එස් මෞනගුරු.

13) ඇතැම් ප්‍රෙක්ෂකාගාර තුළ භාවිතයට ගනු ලබන කැරකෙන වේදිකාව නිසා දර්ශන තලයන් වහා වෙනස් කළ හැකි වන්නේ,

(1) නෝ රංග පීඨය

(2) කබුකි රංගපීඨය

(3) ග්ලොබ් රංග පීඨය

(4) රූකඩ රංග පීඨය

14) අංග රචනයේදී මුහුණ කොටස් කීයකට බෙදේ ද?

(1) හතකට

(2) හයකට

(3) අටකට

(4) තුනකට

15) රංග රචනයේදී වඩාත්ම සැලකිල්ලට ගත යුත්තේ,

(1) පසුතල නිර්මාණය හා වේදිකා අලංකරණ, නර්තනය හා සංගීතය

(2) දෘශ්‍යමය ප්‍රබලත්වය ,අර්ථය ප්‍රකාශ විම සමබරතාවය හා නිර්මාණාත්මක බව

(3) අංගරචනයේ ප්‍රබලත්වය, වේශභූෂණවල නිරමාණාත්මක බව හා රංගාලෝකයයි

(4) නර්තනය සංගීතය හා නාට්‍යෝපකරණ නිර්මාණාත්මක ලෙස භාවිතයයි.

16) නාට්‍යයක් නිරමාණය කල පසු එහි නිර්මාණශිලිත්වය රදා පවතින්නේ ,

(1) අධ්‍යක්ෂකවරයා හා නළුනිළියන් ගේ කැපවීම මතය

(2) ආනුෂාංගික ශිල්පීන්ගේ සහයෝගය මතය.


(3) ප්‍රේක්ෂක ප්‍රතිචාර මතය

(4) නාට්‍ය දිග හැරෙන ආකාරය මතය.

● පහත දැක්වෙන ඡායාරූප දෙක ඇසුරෙන් 17 සිට 20 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



ක



ග

17)මෙහි 'ක 'ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරුවා වන්නේ,

(1) එස් විද්‍යානන්දන් (2) බන්දුල ජයවර්ධන ය

(3) කේ. බි හේරත් ය (4) ගුණසේන ගලප්පත්ති ය

18)'ක' රූපයේ දැක්වෙන නාට්‍යකරුගේ නිර්මාණ දෙකක් වන්නේ

(1) ඔතැලෝ (2) බෙර හඬ, හිත හොඳ අම්මණ්ඩි

(3) සුදු කරල් , දෝන කතිරිනා (4) මූදු පුත්තු, ලිය තඹරා

19) මෙහි 'ග 'ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරුවා වන්නේ,

(1) ආර් . ආර් සමරකෝන් ය (2) හෙන්රි ජයසේන

(3) ජයලත් මනෝරත්න ය . (4) දයානන්ද ගුනවර්ධන

20)මෙහි 'ග 'ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරුගේ නිර්මාණ දෙකක් වන්නේ,

(1) කැළනි පාළම, අහසින් වැටුණු මිනිස්සු (2) හුණුවටයේ කතාව, දිරිය මව සහ ඇගේ දරුවෝ

(3) සඳගිරි, තලමල පිපිලා (4) නරි බෑනා , ඉබි කට්ට

● පහත දැක්වෙන වෙස් මුහුනු දෙක ආශ්‍රයෙන් 21 සිට 22 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

21) මෙහි දැක්වෙන වෙස් මුහුණු අතුරෙන් ,

(1) 'ක'සන්නි මුහුණකි. 'ග' කෝලම් මුහුණකි.

(2) 'ක'කෝළම් මුහුණකි. 'ග' සන්නි මුහුණකි.

(3) 'ක' 'ග' සන්නි මුහුණ දෙකකි.

(4) 'ක' 'ග' කෝළම් මුහුණ දෙකකි.




ක



ග

22) මෙම වෙස් මුහුණු දෙක,

(1) පොලිස් කෝළම හා ගොළු සන්නියයි

(2) ඒකපාත සන්නිය හා හේවා කෝලමයි

(3) අමුක්කු සන්නිය, මුදලි කෝලම

(4) ඒකපාත සන්නිය , දේව සන්නිය

23) සියළුම අංග නාඩගම හා සම්බන්ධ වරණය වන්නේ,

(1) බම්මන්නා ,කාරියකරවන රාල,කරළිය, කිට්සන් ලාම්පු

(2) බහුබූත කෝලමා ,කාරියකරවන රාල,තානායම් පොළ, කිට්සන් ලාම්පු

(3)සෙල්ලම් ළමා ,පොතේ ගුරු ,කරළිය, කිට්සන් ලාම්පු

(4) ඉන්නිස ,දක්ෂිණ භාරතීය සංගීතය,පොතේ ගුරු, ප්‍රේක්ෂාගෘහය

- පහත දැක්වෙන තොරතුරු ඇසුරින් අංක 24 සිට 27 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

A - රට යකුම

B - සොකරි නාටකය

C - සූනියම් යාගය

D - දෙවොල් මඩුව

E - කොහොඹා කංකාරිය

F - පහන් මඩුව

G - ගම් මඩුව

H - සන්නි යකුම

24) නානුමුරය හා ගුරුගේ මාලාව නාට්‍යමය අවස්ථා ඇතුළත් ශාන්තිකර්ම පිළිවෙළින් දැක්වෙන්නේ,

(1) B, හා D ය. (2) A, හා E ය.

(3) C, හා D ය. (4) E හා F ය.

25)අඹ විදමන හා කපුයක්කාරිය නාට්‍යමය අවස්ථා ඇතුළත් ශාන්තිකර්ම පිළිවෙලින් දැක්වෙන්නේ,

(1) A, හා D ය. (2) A, හා C ය.

(3) C, හා E ය. (4) F හා A ය.

26)රාමා මැරීම හා ගබඩා කොල්ලය නාට්‍යමය අවස්ථා ඇතුළත් ශාන්තිකර්ම පිළිවෙලින් දැක්වෙන්නේ,

(1) B, හා D ය. (2) D, හා E ය.

(3) C, හා D ය (4) A හා E ය.

27) උඩරට සම්ප්‍රදායට පමණක් ආවේනික වන්නේ

(1) B, හා D ය.　　(2) B, හා F ය.

(3) B, හා E ය.　　(4) E හා F ය.

● පහත දැක්වෙන වගුව ඇසුරෙන් 28 සිට 33 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | මුල් කෘතියේ රචක | පරිවර්තනයේ/ අනුවර්තනයේ නම | මෙරට නිෂ්පාදකගේ නම |
|---|---|---|---|
| ලේඩි ෆොම් ද සී | ක | ග | ජ |
| ට | ඩ | කඹය | ණ |

28) ඉහත වගුවේ 'ක' කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම වන්නේ ,

(1) විලියම් ශේක්ෂ්පියර්　　(2) ඇලෙක්සැන්ඩර් වැම්ප්ලේව්

(3) හෙන්රික් ඉබ්සන්　　(4) ප්ලෝටස්

29) ඉහත වගුවේ 'ඩ' කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම වන්නේ ,

(1) ප්ලෝටස්　　(2) හෙන්රික් ඉබ්සන්

(3) ඇන්ටන් චෙකොෆ්　　(4) ශ්‍රී හර්ෂ

30) ඉහත වගුවේ 'ග' කොටුවට ඇතුළත් විය යුතු නාට්‍යයේ නම වන්නේ ,

(1) ට්‍රෝජන් කාන්තාවෝ　　(2) සයුරෙන් ආ ළඳ

(3) මකරාක්ෂයා　　(4) ගොඩෝ එනකං

31) ඉහත වගුවේ 'ජ' කොටුවට ඇතුළත් විය යුතු නිෂ්පාදකයාගේ නම වන්නේ ,

(1) සුනන්ද මහේන්ද්‍ර　　(2) මැන්දිස් රෝහණධීර

(3) ප්‍රේම රංජිත් තිලකරත්න　　(4) සුනිල් විජේසිරිවර්ධන

32) ඉහත වගුවේ 'ට' කොටුවට ඇතුළත් විය යුතු නාට්‍යයේ නම වන්නේ ,

(1) ද ලෝවර් ඩෙප්ත්ස්　　(2) ඇලෙක්සැන්ඩර් වැම්ප්ලේව්

(3) ද පබ්ලික් එනිමි　　(4) රූඩන්ස්

33) ඉහත වගුවේ 'ණ' කොටුවට ඇතුළත් විය යුතු නිෂ්පාදකවරයාගේ නම වන්නේ ,

(1) පියදාස නිශ්ශංක　　(2) බන්දුල ජයවර්ධන

(3) සුගතපාල ද සිල්වා　　(4) විජිත ගුණරත්න

● 34 සිට 40 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

34) වේදිකා නාට්‍යයක් යන්න හැඳින්වීම නොගැලපෙන පිලිතුර වන්නේ ,

(1) කිසියම් ආකාරයක ජීවිතය අනුකරණය කිරීමකි.

(2) කලා ප්‍රභේද කිහිපයක සංකලනයෙන් බිහි වූවකි.

(3) සෑම විටම සිද්ධි කාලානුරූපිව ගොනුකොට ඉදිරිපත් කරන්නකි.

(4) ඕනෑම වැඩිහිටි ප්‍රේක්ෂක පිරිසකට ගෝචර වූවකි.

35) 'රංග භූමි අලංකරණ ' යන්නට නොගැලපෙන පිලිතුර වන්නේ ,

(1) එහා මෙහා ගෙන යාමට ,සවිකිරීමට ගැලවීමට පහසු ආකාරයෙන් තිබිය යුතුය.

(2) පුස්ත යන නමින් හැඳින්වේ

(3) සෑම නාට්‍යකටම අත්‍යවශ්‍ය අංගයකි.

(4) මේවා නාට්‍යය නිර්මාණය හා බද්ධ විය යුතුය.

36) අංගරචනා ශිල්පියා වඩාත් සහයෝගයෙන් කටයුතු කල යුතු වන්නේ ,

(1) වේෂභූෂණ ශිල්පියා,පසුතල නිර්මාණ ශිල්පියා හා රංගාලෝක ශිල්පියා

(2) පසුතල නිර්මාණ ශිල්පියා,රංගාලෝක ශිල්පියා හා පිටපත් රචකයා

(3) වේෂභූෂණ ශිල්පියා,නාට්‍ය නිෂ්පාදකයා හා නාට්‍ය අධ්‍යක්ෂකවරයා

(4) වේෂභූෂණ ශිල්පියා,පසුතල නිර්මාණ ශිල්පියා හා ප්‍රේක්ෂකයා .

37) දකුණුපස දැක්වෙන නාට්‍ය කරුවා වන්නේ ,



(1) සී .දොන් බස්තියන්

(2) චාල්ස් ඩයස්

(3) ජෝන් ද සිල්වා

(4) එස් මෞනගුරු

38) ඔහු වඩාත් ප්‍රසිද්ධ වන්නේ ,

(1) සොකරි වලටයි .

(2) කෝලම් වලටයි

(3) නාඩගම් වලටයි

(4) නූර්ති වලටයි

39) සිංහල නාට්‍ය වංශයේ නූතන යුගය සනිටුහන් වන්නේ ,

(1) නාඩගම් වලින් පසුවය

(2) නූර්ති වලින් පසුවය

(3) මනමේ නාටකයෙන් පසුවය

(4) සොකරි රග දැක්වමෙන් පසුව ය .

40) 'සතර අභිනය 'යන්නට නොගැලපෙන ප්‍රකාශය වන්නේ,

(1) සිව් වැදෑරුම් වේ

(2) විශේෂයෙන් නාට්‍යයේදි යොදා ගැනේ

(3) යුරෝපයෙන් බිහි වි මෙරට ප්‍රචලිත වූවකි.

(4) මුල්වරට භරත මුනිවරයාගේ නාට්‍ය ශාස්ත්‍රයේ සඳහන් වේ .